අධ්‍යාපන අමාත්‍යාංශය

(උසස් අධ්‍යාපන අංශය)

# ශ්‍රී ලාංකික සිසුන් සඳහා විදේශීය රටවල් /ආයතන මගින් පිරිනමනු ලබන විදේශ ශිෂ්‍යත්ව සම්බන්ධ මාර්ගෝපදේශ සංග්‍රහය

# 2023

❖ අධ්‍යාපන අමාත්‍යාංශය, උසස් අධ්‍යාපන අංශය, අංක 18, වෝඩ් පෙදෙස,කොළඹ 07

## හැඳින්වීම

නිදහසින් පසු ශ්‍රී ලංකාව ගෝලීය වශයෙන් වැදගත් ආර්ථික, සමාජීය, දේශපාලන හා සංස්කෘතික සබඳතාවන් රැසක් වර්ධනය කර ගැනීමට පෙළඹීමත් සමඟ විවිධ විදේශ රාජ්‍යයන් සමඟ එම සබඳතාවන් හුවමාරු කර ගැනීමට අවස්ථාව සැලසුණි. එහි ප්‍රතිඵලයක් ලෙස අධ්‍යාපනික හා සංස්කෘතික අවස්ථාවන් හුවමාරු කර ගැනීමට ද ඉඩ ප්‍රස්ථාවන් සැලසුණි. මිත්‍ර රාජ්‍යය හා අනෙකුත් විදේශ රාජ්‍යය විසින් එම රටවල් වල අධ්‍යාපනික හා සංස්කෘතික වටිනාකම් ගෝලීය වශයෙන් බෙදා හැරීමේ එක් ප්‍රතිඵලයක් ලෙස මෙරට සිසුන්ට විදේශීය රටවල් වෙත ගොස් එම රටවල් වල අධ්‍යාපනික කටයුතු කිරිමේ අවස්ථාව ලැබුණි. මේ දක්වා විවිධ විදේශ රාජ්‍යයන් විසින් මෙරට සිසුන් වෙත ප්‍රථම උපාධි හා පශ්චාත් උපාධි හැදෑරීම සඳහා ශිෂ්‍යත්ව අවස්ථාවන් පිරිනැමූ අතර එම ශිෂ්‍යත්ව අවස්ථාවන්වලින් සිසුන් උපරිම ප්‍රයෝජන ලබා ගනු ලබන අතර වර්තමානයේදී සිසුන් විදේශ ශිෂ්‍යත්ව සම්බන්ධයෙන් විශාල උනන්දුවක් දක්වන අතර වාර්ෂිකව අධ්‍යාපන අමාත්‍යාංශය හරහා ප්‍රථම හා පශ්චාත් උපාධි විශාල ප්‍රමාණයක් පිරිනමනු ලබයි.

ශ්‍රී ලාංකික සිසුන් සඳහා අධ්‍යාපනික ඉඩ ප්‍රස්ථාවන් පුළුල් කිරීමේ අරමුණින් හා දැනුමින් සපිරි මානව සම්පතක් බිහිකිරීමේ අරමුණු පෙරදැරිව විදේශ රටවල් හා ආයතන මගින් මෙරට සිසුන් වෙත පිරිනමනු ලබන ප්‍රථම හා පශ්චාත් උපාධි හැදෑරීම සඳහා ලබාදෙනු ලබන ශිෂ්‍යත්ව අවස්ථාවන් සම්බන්ධයෙන් කටයුතු කිරීම අධ්‍යාපන අමාත්‍යාංශයේ උසස් අධ්‍යාපන අංශයේ මූලික කාර්යභාර්යයකි. එබැවින් මෙම ශිෂ්‍යත්ව වැඩ සටහන් සඳහා අයදුම් කිරීම, සිසුන් තෝරා ගැනීම හා නාම යෝජනා ඉදිරිපත් කිරීමත් අදාළ ක්‍රියාවලිය සම්බන්ධයෙන් වූ දැනුවත්භාවයක් හා මගපෙන්වීමක් ලබා දීමත් මෙම මාර්ගෝපදේශ සංග්‍රහය නිකුත් කිරීම මගින් බලාපොරොත්තු වේ.

එහිදී මූලික වශයෙන් පහත කරුණු කෙරෙහි අවධානය යොමු කිරීමට අපේක්ෂා කරන අතර ශිෂ්‍යත්ව සම්බන්ධයෙන් වූ යාවත්කාලීන තොරතුරු අමාත්‍යාංශ වෙබ් අඩවිය (www.mohe.gov.lk) මගින් ලබා ගත හැකිය.

1. විදේශ රටවල්/ආයතන විසින් ශිෂ්‍යත්ව ලබා දෙන ක්‍රම
2. සෘජු නාම යෝජනා කැඳවීම යටතේ ශිෂ්‍යත්ව පිරිනමනු ලබන රටවල් හා අදාළ කාලසීමාවන්
3. ශිෂ්‍යත්ව වැඩ සටහනක් ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලිය සිදුවන ආකාරය
4. ශිෂ්‍යත්ව සඳහා අයදුම් කිරීමේ මූලික කොන්දේසි
5. අයදුම්පත් යොමු කිරීමේ ක්‍රමවේදය
6. අයදුම්පත් ප්‍රමුඛතා ගත කිරීමේ ක්‍රියාවලිය
7. සම්මුඛ පරීක්ෂණ සඳහා තෝරා ගැනීමේ ක්‍රියාවලිය
8. ශිෂ්‍යත්ව සඳහා නාම යෝජනා හා අයදුම්පත් අදාළ රටවල් වෙත යොමු කිරීමේ ක්‍රියාවලිය
9. ශිෂ්‍යත්ව සඳහා අදාළ රටවල් විසින් සිසුන් තෝරා ගැනීමේ ක්‍රියාවලිය
10. වීසා හා අනෙකුත් සම්බන්ධීකරණ කටයුතු
11. ශිෂ්‍යත්ව අවසන් කර සිසුන් මෙරටට පැමිණීමෙන් පසු ක්‍රියාවලිය
12. ශිෂ්‍යත්ව සම්බන්ධයෙන් තොරතුරු ලබා ගත හැකි ආකාරය

## 01. විදේශ රටවල්/ආයතන විසින් ශිෂ්‍යත්ව ලබා දෙන ක්‍රම

විදේශ රටවල් මගින් ලබා දෙනු ලබන ශිෂ්‍යත්ව අවස්ථාවන් මූලික වශයෙන් පහත පරිදි දැක්විය හැකිය.

- ❖ රටවල් අතර ඇති කර ගනු ලබන අවබෝධතා ගිවිසුම් (MOU) මගින් හා අමාත්‍යාංශය වෙත විදේශ රටවල් විසින් නාම යෝජනා කැඳවීම හරහා ලබා දෙනු ලබන ශිෂ්‍යත්ව
- ❖ විදේශ රටවල්/ආයතන මගින් ලබා දෙනු ලබන සෘජු ශිෂ්‍යත්ව (Direct Scholarships)

**විදේශ රටවල් විසින් නාම යෝජනා කැඳවීම හරහා ලබා දෙනු ලබන ශිෂ්‍යත්ව වැඩසටහන්**

විදේශයන් හි පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාල හා මහකොමසාරිස් කාර්යාල හරහා මෙන්ම මෙරට පිහිටි විදේශීය තානාපති /මහ කොමසාරිස් කාර්යාල මගින් මෙම ශිෂ්‍යත්ව වැඩ සටහන් සම්බන්ධ තොරතුරු විදේශ කටයුතු අමාත්‍යාංශය හරහා මෙම අමාත්‍යාංශය වෙත යොමු කරනු ලැබේ. මෙහිදී අධ්‍යාපන අමාත්‍යාංශය විසින් මෙම වැඩසටහන් සඳහා සුදුසු සිසුන් තෝරා නාම යෝජනා කිරීමේ කටයුතු සිදුකරනු ලැබේ.

**විදේශ රටවල්/ආයතන මගින් ලබා දෙනු ලබන සෘජු ශිෂ්‍යත්ව (Direct Scholarships)**

රටවල් හා ආයතන මගින් සෘජුවම ශිෂ්‍යත්ව වැඩසටහන් සඳහා අයදුම්පත් කැඳවනු ලබන අවස්ථා ඇත. එම ශිෂ්‍යත්ව වැඩසටහන් සම්බන්ධයෙන් විස්තර අමාත්‍යාංශ වෙබ් අඩවියේ පළකරනු ලබන අතර සිසුන්ට එම ශිෂ්‍යත්ව වැඩසටහන් සඳහා සෘජුවම අයදුම් කළ හැකිය.

## 02. සෘජු නාම යෝජනා කැඳවීම යටතේ ශිෂ්‍යත්ව පිරිනමනු ලබන රටවල් හා අදාළ කාලසීමාවන්

- ❖ **ප්‍රථම උපාධි ශිෂ්‍යත්ව වැඩසටහන්**

| අංක | රට | දැන්වීම් පළකරනු ලබන කාල සීමාව | ශිෂ්‍යත්ව පිරිනමනු ලබන කාල සීමාව |
|---|---|---|---|
| 1 | ඉන්දියාව | ජනවාරි - පෙබරවාරි | ජූනි-ඔක්තොබර් |
| 2 | හංගේරියාව | නොවැම්බර් | ජූනි-අගෝස්තු |
| 3 | ජපානය | අප්‍රේල් | මාර්තු |
| 4 | කියුබාව | අගෝස්තු | නොවැම්බර් |
| 5 | සර්බියාව | සැප්තැම්බර් | දෙසැම්බර්-ජනවාරි |
| 6 | ඉන්දියාව (ආයුෂ් ශිෂ්‍යත්ව) | ජූනි | නොවැම්බර් |

❖ **පශ්චාත් උපාධි ශිෂ්‍යත්ව වැඩසටහන්**

| **අංක** | **රට** | **දැන්වීම් පළතරනු ලබන කාලසීමාව** | **ශිෂ්‍යත්ව පිරිනමනු ලබන කාල සීමාව** |
|---|---|---|---|
| 1 | ඉන්දියාව | ජනවාරි - පෙබරවාරි | ජුනි-ඔක්තොබර් |
| 2 | චීනය | නොවැම්බර් | ජූලි |
| 3 | ජපානය | අප්‍රේල් | මාර්තු |
| 4 | හංගේරියාව | නොවැම්බර් | ජුනි-අගෝස්තු |
| 5 | එක්සත් රාජධානිය | අගෝස්තු | දෙසැම්බර් |
| 6 | ඉන්දියාව (ආයුෂ් ශිෂ්‍යත්ව) | ජුනි | නොවැම්බර් |

**සටහන - ශිෂ්‍යත්ව පිරිනමනු ලබන රට/ආයතනය අනුව හා අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ඒ ඒ ශිෂ්‍යත්ව පිරිනැමීමට අදාළව ගනු ලබන තීරණ අනුව ඉහත කාලසීමාන් වරින් වර වෙනස් විය හැක.**

## 03. ශිෂ්‍යත්ව වැඩ සටහනක් ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලිය සිදුවන ආකාරය

ශිෂ්‍යත්ව පිරිනමනු ලබන රටවල් වෙතින් ප්‍රදාන ලිපි සම්බන්ධ නිවේදනය ලැබීම

↓

වෙබ් හා පුවත්පත් දැන්වීම් පළකිරීම

↓

මාර්ගගත ක්‍රමවේදය හරහා අයදුම්පත් ලබා ගැනීම

↓

සලකා බලනු ලබන නිර්ණායක මත පදනම්ව සිසුන්ගේ අයදුම්පත් ප්‍රමුඛතාගත කිරීම

↓

සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවීමේ ලිපි නිකුත් කිරීම

↓

සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම

↓

සම්මුඛ පරීක්ෂණ ප්‍රතිඵල මත සුදුසු අයදුම්කරුවන් තෝරා ගැනීම

↓

නාම යෝජනා අදාළ රටවල් වෙත යොමු කිරීම

↓

අදාළ රටවල් විසින් තෝරා ගැනීමේ ප්‍රදාන ලිපි අමාත්‍යාංශය වෙත ලැබීම

↓

තෝරාගැනීම සම්බන්ධ ප්‍රදාන ලිපි අයදුම්කරුවන් වෙත යොමු කිරීම

04. ශිෂ්‍යත්ව සඳහා අයදුම් කිරීමේ මූලික කොන්දේසි

❖ **ප්‍රථම උපාධි ශිෂ්‍යත්ව වැඩසටහන්**

- ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.
- අදාළ වයස් සීමාවන් සපුරා තිබිය යුතුය. (ශිෂ්‍යත්ව පිරිනමන රටවල් විසින් අදාළ වයස් සීමාව දෙනු ලැබේ.)
- අවම වශයෙන් S සාමාර්ථ තුනක් සහිතව අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය සමත් විය යුතුය. (ශිෂ්‍යත්ව වැඩසටහන අනුව වෙනස් විය හැක.)
- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ වූ රාජ්‍ය විශ්වවිද්‍යාලයක උපාධි පාඨමාලාවක් හැදෑරීම සඳහා අභ්‍යන්තර සිසුවෙකු ලෙස ලියාපදිංචි වූ අයෙකු නොවිය යුතුය.
- ඉංග්‍රීසි භාෂාව පිළිබඳ නිපුණත්වය (මෙය ශිෂ්‍යත්වය ලබාදෙන භාෂා මාධ්‍ය අනුව තීරණය වේ.)
- මනා ශරීර සෞඛ්‍යයකින් පසුවිය යුතුය.

❖ **පශ්චාත් (ශාස්ත්‍රපති/විද්‍යාපති) උපාධි ශිෂ්‍යත්ව වැඩසටහන්**

- ශ්‍රී ලංකික පුරවැසියෙකු විය යුතුය.
- අදාළ වයස් සීමාවන් සපුරා තිබිය යුතුය. (ශිෂ්‍යත්ව පිරිනමන රටවල් විසින් අදාළ වයස් සීමාව දෙනු ලැබේ.)
- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් අදාළ අධ්‍යයන ක්ෂේත්‍රය සහිතව උපාධියක් ලබා තිබිය යුතුය. (ශිෂ්‍යත්ව පිරිනමනු ලබන රට අනුව උපාධියේ පන්ති සමාර්ථය සලකා බලනු ලැබේ.)
- ඉංග්‍රීසි භාෂාව පිළිබඳ නිපුණත්වය (මෙය ශිෂ්‍යත්වය ලබාදෙන භාෂා මාධ්‍ය අනුව තීරණය වේ.)
- මනා ශරීර සෞඛ්‍යයකින් පසුවිය යුතුය.

❖ **පශ්චාත් (ආචාර්ය) උපාධි ශිෂ්‍යත්ව වැඩසටහන්**

- ශ්‍රී ලංකික පුරවැසියෙකු විය යුතුය.
- අදාළ වයස් සීමාවන් සපුරා තිබියයුතුය. (ශිෂ්‍යත්ව පිරිනමන රටවල් විසින් අදාළ වයස් සීමාව දෙනු ලැබේ.)
- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් අදාළ අධ්‍යයන ක්ෂේත්‍රයේ උපාධියක් සහ ශාස්ත්‍රපති උපාධියක් ලබා තිබිය යුතුය. (ශිෂ්‍යත්ව පිරිනමනු ලබන රට අනුව උපාධියේ පන්ති සමාර්ථය සලකා බලනු ලැබේ.)
- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් අදාළ අධ්‍යයන ක්ෂේත්‍රයේ ශාස්ත්‍රපති/විද්‍යාපති උපාධියක් ලබා තිබිය යුතුය. (ශිෂ්‍යත්ව පිරිනමනු ලබන රට අනුව උපාධියේ පන්ති සමාර්ථය සලකා බලනු ලැබේ.)
- ඉංග්‍රීසි භාෂාව පිළිබඳ නිපුණත්වය (මෙය ශිෂ්‍යත්වය ලබාදෙන භාෂා මාධ්‍ය අනුව තීරණය වේ.)

- මනා ශරීර සෞඛ්‍යයකින් පසුවිය යුතුය.

❖ **සටහන- ශිෂ්‍යත්ව පිරිනමනු ලබන රට/ආයතනය අනුව හා අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ඒ ඒ ශිෂ්‍යත්ව පිරිනැමීමට අදාළව ගනු ලබන තීරණ අනුව ඉහත කොන්දේසි වරින් වර වෙනස් විය හැක.**

## 05. අයදුම්පත් යොමු කිරීමේ ක්‍රමවේදය

- විදේශ රටවල් මගින් ශිෂ්‍යත්ව වැඩ සටහන් සම්බන්ධයෙන් අමාත්‍යාංශය වෙත දැනුම්දීමෙන් පසු අමාත්‍යාංශයීය වෙබ් අඩවියේ (www.mohe.gov.lk) භාෂාත්‍රයෙන් පලවන ජාතික පුවත්පත්වල හා අමාත්‍යංශ නිල ෆෙස්බුක් පිටුව මගින් අදාළ දැන්වීම් පළකර අයදුම්පත් කැඳවනු ලැබේ.
- ශිෂ්‍යත්ව සඳහා අයදුම්පත් යොමු කිරීම සඳහා අමාත්‍යාංශය මගින් මාර්ගගත අයදුම්පත් යොමුකිරීමේ ක්‍රමවේදයක් හඳුන්වා දී ඇති අතර, අදාළ වෙබ් දැන්වීම් පළකරනු ලබන අවස්ථාවන් වලදී අදාළ මාර්ගගත අයදුම්පත් යොමු කිරීමේ දිගුවද සඳහන් කරනු ලබන අතර ඒ මගින් සිසුන්ට සිය අයදුම්පත් යොමු කල හැකිය.

### මාර්ගගතව (online) අයදුම්පත් යොමු කිරීමේ ක්‍රියාවලිය

- අධ්‍යාපන අමාත්‍යාංශයේ උසස් අධ්‍යාපන අංශය මගින් ශිෂ්‍යත්ව සම්බන්ධ අදාළ වෙබ් දැන්වීම් පළකරනු ලබන අවස්ථාවේදී මාර්ගගත දිගුව (https://foreignscholarships.mohe.gov.lk) සඳහන් කරනු ලබන අතර ඒ හරහා පහත පරිදි අයදුම්පත් යොමුකළ යුතුවේ.

වෙබ් දැන්වීමේ ඇති මාර්ගගත දිගුව මගින් වෙබ් ද්වාරය වෙත ප්‍රවේශ වී ලියාපදිංචි වීම


↓

ලබා දී ඇති උපදෙස් අනුව අයදුම්පත පිරවීම

↓


මාර්ගගත අයදුම්පත අමාත්‍යාශය වෙත යොමුකිරීම
**(ක්‍රියාවලිය අවසානයේ ලැබෙන PDF ගොනුව තැපැල් මගින් එවීමට අවශ්‍ය නොවේ)**

<u>පළමු පියවර</u>





ලියාපදිංචිම සඳහා Register මත click කරන්න.

දෙවන පියවර





අවශ්‍ය දත්ත සම්පූර්ණ කිරීමෙන් පසුව Register මත click කරන්න. මෙහිදී ඔබ විසින් ලබා දෙනු ලබන මුරපදය Password නැවත අවශ්‍ය වන බැවින් එය මතක තබා ගත හැකි වන පරිදි සුදුසු ක්‍රමයක් යොදා ගැනීම වැදගත් වේ.

තුන්වන පියවර




Sign in බොත්තම මත click කරන්න.

හතරවන පියවර




Scholarship type මගින් ඔබ අයදුම් කිරීමට අපේක්ෂිත ශිෂ්‍යත්ව වැඩ සටහන තෝරා ගෙන continue මත click කර දක්වා ඇති උපදෙස් අනුව කටයුතු කරන්න.

අයදුම්පත යොමුකර අවසානයේ PDF පිටපත භාගත කර ගන්න.

අයදුම්පත් තපැල් මගින් යොමු කිරීමක් අවශ්‍ය නොවන අතර අයදුම්පත් යොමු කිරීමේ අවසාන දිනට හෝ ඊට පෙර අධ්‍යාපන අමාත්‍යාංශයට (උසස් අධ්‍යාපන අංශයට) සෘජුවම මාර්ගගතව (online) අයදුම්පත් ඉදිරිපත් කළ යුතු වේ. වෙනත් මාර්ගවලින් ලැබෙන අයදුම්පත් කිසිම අවස්ථාවකදී සලකා බලනු නොලැබේ.

## 06. අයදුම්පත් ප්‍රමුඛතාගත කිරීමේ ක්‍රියාවලිය

ශිෂ්‍යත්ව වැඩ සටහන් සඳහා අයදුම්පත් අමාත්‍යාංශය වෙත ලැබීමෙන් අනතුරුව, මූලික සුදුසුකම් හා ශිෂ්‍යත්ව කොන්දේසි සපුරා ඇති අයදුම්කරුවන් කෙටි ලැයිස්තු ගත කරනු ලැබේ. පිරිනමනු ලබන ශිෂ්‍යත්ව සංඛ්‍යාව මත පදනම්ව හා අදාළ රට විසින් ලබා දී ඇති උපදෙස් අනුව ශිෂ්‍යත්ව සඳහා කැඳවන අයදුම්කරුවන්ගේ සංඛ්‍යාව තීරණය කරනු ලබන අතර ඒ අනුව සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවීමට අදාළව අයදුම්පත් ප්‍රමුඛතා ගත කරනු ලැබේ.

ප්‍රථම උපාධි ශිෂ්‍යත්ව වැඩ සටහන් සඳහා අ.පො.ස උසස් පෙළ විභාගයේදි දක්වන කුසලතාව මත [ඉසෙඩ් අගය (Z. Score) මත] පදනම්ව හා ශිෂ්‍යත්ව සඳහා තෝරාගනු ලබන කොන්දේසි අනුව අයදුම්කරුවන් ප්‍රමුඛතාගත කරනු ලැබේ. ඒ අනුව අදාළ අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවනු ලැබේ.

පශ්චාත් උපාධි සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන විශ්වවිද්‍යාලයකින් ලබාගත් ප්‍රථම උපාධියේ කුසලතාව හා ඒ ඒ ශිෂ්‍යත්ව සඳහා තෝරාගනු ලබන කොන්දේසි අනුව අයදුම්කරුවන් ප්‍රමුඛතාගත කරනු ලැබේ. ඒ අනුව අදාළ අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවනු ලැබේ.

## 07. සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම

ශිෂ්‍යත්ව වැඩ සටහන් සඳහා සිසුන් තෝරා ගැනීමේ ක්‍රියාවලියේදී ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් සිසුන් තෝරා ගැනීම සිදුකරනු ලබයි. සම්මුඛ පරීක්ෂණ පැවැත්වීමේ ක්‍රියාවලිය පහත පරිදි ක්‍රියාත්මක කරනු ලබයි.

**1** සම්මුඛ පරීක්ෂණ මණ්ඩල පත්කිරීම

↓

**2** ශිෂ්‍යත්ව වැඩසටහන් සඳහා අයදුම්කරුවන් තෝරා ගැනීමේ ක්‍රියාවලිය සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය විසින් විෂය ක්ෂේත්‍රයන් හි පළපුරුදු ආචාර්ය මහචාර්යවරුන්ගේ මෙන්ම පහත සඳහන් නිළධාරින්ගෙන් සමන්විත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් පත්කරනු ලැබේ.

↓

**3**

**ප්‍රථම උපාධි සඳහා**

- අමාත්‍යාංශයේ අධ්‍යක්ෂක ධුරයේ නියෝජනයක්
- විශ්වවිද්‍යාල ආචාර්ය නියෝජනයක් (විෂය ධාරාවට අදාළව)
- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නියෝජනයක්
- විදේශ කටයුතු අමාත්‍යාංශයේ නියෝජනයක්

**පශ්චාත් උපාධි සඳහා**

- අමාත්‍යාංශයේ අතිරේක ලේකම් ධුරයේ නියෝජනයක්
- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නියෝජනයක්
- විශ්වවිද්‍යාල මහාචාර්ය නියෝජනයන් 2 ක් (විෂය ධාරාවට අදාළව)
- වෙනත් අමාත්‍යාංශයක නියෝජනයක්
- විදේශ කටයුතු අමාත්‍යාංශයේ නියෝජනයක්

**A** සම්මුඛ පරීක්ෂණ සඳහා තෝරාගත් අයදුම්කරුවන් සඳහා කැඳවීමේ ලිපි යොමු කිරීම

↓

**B** ශිෂ්‍යත්ව වැඩසටහන් සඳහා සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවීමට සුදුසුකම් ලබන අයදුම්කරුවන් සඳහා අමාත්‍යාංශය මගින් කැඳවීමේ ලිපි Email මගින් දැනුම්දෙනු ලැබේ.

↓

**C**

**සම්මුඛ පරීක්ෂණ සඳහා රැගෙන ආ යුතු මූලික ලිපි ලේඛන -**

**ප්‍රථම/පශ්චාත් උපාධි සඳහා අවශ්‍ය මූලික ලිපි ලේඛන**

- උප්පැන්න සහතිකය
- ජාතික හැඳුනුම්පත/වලංගු ගමන් බලපත්‍රය
- වෙනත් සහතික වල පිටපත් (ක්‍රීඩා හා නායකත්ව /රට නියෝජනය කරමින් ලබාගත් ජයග්‍රහණ )
- ඉංග්‍රීසි භාෂාව පිළිබඳ නිපුණත්වය

**අධ්‍යාපනික සහතික**

- ප්‍රථම උපාධි සඳහා අයදුම්කරුවන් අ.පො.ස උසස් පෙළ විභාගයේ ඉසෙඩ් අගය සහිතව ප්‍රතිඵල ලේඛනය හා සාමන්‍ය පෙළ ප්‍රතිඵල ලේඛන වල මුල් පිටපත් ඉදිරිපත් කළ යුතුය.
- පශ්චාත් උපාධි සඳහා අයදුම්කරුවන් අදාළ උපාධි සහතික වල මුල් පිටපත්
- Publications/Books/extract ආදිය ඉදිරිපත් කළ යුතුය.

## 08. සම්මුඛ පරීක්ෂණවලින් පසුව අයදුම්කරුවන් ශිෂ්‍යත්ව සඳහා නාම යෝජනා කිරීම සඳහා තෝරා ගැනීම

සම්මුඛ පරීක්ෂණයේදී අයදුම්කරුවන් දක්වන කුසලතාවය මත ශිෂ්‍යත්ව සඳහා තෝරා ගැනීම සිදුකරනු ලබන අතර ඒ ඒ රටවල් විසින් ලබාදෙනු ලබන ශිෂ්‍යත්ව සංඛ්‍යා අනුව රටවල් වෙත නාම යෝජනා ඉදිරිපත් කරනු ලැබේ. අදාළ රටවල් විසින් අතිරේක නාම යෝජනා එවන ලෙස ඉල්ලා සිටින අවස්ථාවන් හි දී එම නාම යෝජනා ද ප්‍රධාන නාම යෝජනා සමඟ ඉදිරිපත් කරනු ලැබේ. නාම යෝජනා කරන ලද අයදුම්කරුවන් විසින් අදාළ රටවල් හා විශ්වවිද්‍යාල විසින් දක්වා ඇති පරිදි සිය අයදුම්පත් හා අදාළ සහතික පත් හා අනෙකුත් ලිපි ලේඛන ඉදිරිපත් කළ යුතුය.

## 09. ශිෂ්‍යත්ව සඳහා අදාළ රටවල් විසින් තෝරා ගැනීමේ ක්‍රියාවලිය

අදාළ නාම යෝජනා යොමු කිරීමෙන් අනතුරුව එම රටවල් වල ශිෂ්‍යත්ව කොන්දේසි හා තෝරා ගැනීමේ ක්‍රියාවලිය අනුව අයදුම්කරුවන් තෝරාගනු ලබන අතර, තෝරා ගනු ලබන අයදුම්කරුවන්ගේ තොරතුරු විදේශ කටයුතු අමාත්‍යාංශය හරහා හෝ අදාළ රට/ආයතනය / තානාපති කාර්යාල මගින් ඍජුවම මෙම අමාත්‍යාංශය වෙත දැනුම් දෙනු ලබයි.

අධ්‍යාපන අමාත්‍යාංශය මගින් සිසුන් ශිෂ්‍යත්ව වැඩසටහන් සඳහා තෝරා ගැනීමේ ක්‍රියාවලියේදි අදාළ සුදුසුකම් පරීක්ෂා කර බලා ඉහළම සුදුසුකම් සපුරන අයදුම්කරුවන් තෝරා ගනු ලැබුවද අතැම් අවස්ථාවලදී අදාළ රටවල් හෝ ආයතන විසින් ශිෂ්‍යත්ව යම් ප්‍රමාණයක් ප්‍රතික්ෂේප කරන අවස්ථා නිරීක්ෂණය වී ඇත.

- අයදුම්පත් යොමුකිරීමේ දී අයදුම්කරුවන් විසින් සිදුකරනු ලබන අඩුපාඩු
- ශිෂ්‍යත්ව පිරිනමනු ලබන අදාළ රටවල් විසින් ඉදිරිපත් කරන කොන්දේසිවලට අනුකූල නොවන අවස්ථාවලදී

එබැවින් ශිෂ්‍යත්ව සඳහා තෝරාගනු ලබන අයදුම්කරුවන්ගේ අයදුම්පත් යොමුකිරිමේදී අයදුම්පත් නිසිපරිදි සම්පූර්ණ කිරීම අයදුම්කරුවන්ගේ වගකීමක් වන අතර, අදාළ අධ්‍යාපනික සුදුසුකම්වලට ගැලපෙන පාඨමාලා හා විශ්වවිද්‍යාල තෝරාගැනීමේදි අයදුම්කරුවන් වඩා සැලකිලිමත් විය යුතුය.

මෙම අමාත්‍යාංශය වෙත ශිෂ්‍යත්ව ප්‍රදානයන් සම්බන්ධ තොරතුරු ලැබුණු පසුව අදාළ ශිෂ්‍යත්වලාභීන්ට ඒ සම්බන්ධයෙන් දැනුම් දෙනු ලබන අතර ඉදිරි කටයුතු සඳහා අවශ්‍ය මගපෙන්වීම හා උපදෙස් දෙනු ලැබේ.

සියලුම ශිෂ්‍යත්වලාභීන් අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරනු ලබන තොරතුරු පද්ධතියක් හරහා ලියාපදිංචි විම අනිවාර්යය වන අතර ශිෂ්‍යත්වලාභීන්ගේ තොරතුරු පත්‍රිකා පෝරමය පුරවා  මෙම අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කල යුතුය.

## 10. වීසා හා අනෙකුත් සම්බන්ධීකරණ කටයුතු

ශිෂ්‍යත්වලාභීන්ගේ වීසා ලබා ගැනීමේ කටයුතු ඒ ඒ රටවල් විසින් දෙන ලද උපදෙස් අනුව අයදුම්කරුවන් විසින් ක්‍රියාත්මක කලයුතු අතර අවශ්‍ය තනාපති කාර්යාල හා විදේශ කටයුතු අමාත්‍යාංශය මැදිහත්විය යුතු අවස්ථාවන් වලදී මෙම අමාත්‍යාංශය විසින් අවශ්‍ය කටයුතු සිදුකරනු ලැබේ.

## 11. ශිෂ්‍යත්ව අවසන් කර මෙරටට පැමිණීමෙන් පසු ක්‍රියාවලිය

ශිෂ්‍යත්වලාභීන් සිය උපාධිය ලබා අවසන්වීමෙන් පසුව මෙරටට පැමිණි පසුව අමාත්‍යාංශය වෙත පැමිණ උපාධි තොරතුරු ඇතුළත් දත්ත පෝර්මය පිරවිය යුතු අතර විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් උපාධිය පිරිනමනු ලබන විශ්වවිද්‍යාලයේ පිළිගැනීම පිළිබඳ සහතිකයක් ලබා ගත යුතුය. අදාළ තොරතුරු www.ugc.lk වෙබ් අඩවිය මගින් ලබා ගත හැකිය.

## 12. ශිෂ්‍යත්ව සම්බන්ධව තොරතුරු ලබා ගත හැකි ආකාරය

ශිෂ්‍යත්ව සම්බන්ධයෙන් අදාළ කටයුතු අධ්‍යාපන අමාත්‍යාංශයේ උසස් අධ්‍යාපන අංශය තුල ස්ථාපිත විදේශ අධ්‍යාපන අංශය මගින් සිදුකරනු ලබන අතර පහත මාර්ගයන් මගින් අප හා සම්බන්ධ විය හැක.

එමෙන්ම අමාත්‍යාංශ වෙබ් අඩවියේ දක්වා ඇති **Web portal for Pre-Registration** හි ඇති **google form** හි සඳහන් තොරතුරු සම්පූර්ණ කර එවීම මගින් අමාත්‍යාංශය විසින් පලකරනු ලබන ශිෂ්‍යත්ව වැඩ සටහන් සම්බන්ධයෙන් තොරතුරු විද්‍යුත් තැපැල මගින් ගෙන්වා ගත හැක

**Web portal for pre-registration**

Google form:

https://docs.google.com/forms/d/e/1FAIpQLSd1vrvaOyFW5P1jtJ9G9Ors4NzorDpNh5oSW2-eftZB6Y-mwQ/viewform?usp=sf_link

ලිපිනය - අධ්‍යාපන අමාත්‍යාංශය (උසස් අධ්‍යාපන අංශය)
විදේශ අධ්‍යාපන අංශය
අංක 18,වෝඩ් පෙදෙස,කොළඹ 07

වෙබ් අඩවිය - www.mohe.gov.lk

විද්‍යුත් තැපැල - ovse@mohe.gov.lk

දුරකථන අංක - 0112698994 (විදේශ අධ්‍යාපන අංශය)

නිතර අසන පැන

**I. ප්‍රශ්නය - ශිෂ්‍යත්ව සම්බන්ධ තොරතුරු ලබාගන්නේ කෙසේද?**

**පිළිතුර -** අමාත්‍යාංශ වෙබ් අඩියේ (www.mohe.gov.lk) **සියලුම ශිෂ්‍යත්ව සම්බන්ධ තොරතුරු හා** මාර්ගගත අයදුම්පත පළකරනු ලබන අතර, ඒ ඒ කාලවලදී වෙබ් අඩවිය මගින් මාර්ගගතව පමණක් අයදුම්පත් යොමුකල යුතුය.

**II. ප්‍රශ්නය - ශිෂ්‍යත්ව සඳහා අයදුම්පත් යොමුකල යුත්තේ මාර්ගගත ක්‍රමයෙන් පමණක්ද?**

පිළිතුර - ඔව්. තැපැල මගින් යොමු කිරීම අවශ්‍ය නොවන අතර, එලෙස ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

III. **ශිෂ්‍යත්ව ප්‍රදානයන් ලබා ශිෂ්‍යත්ව ප්‍රතික්ෂේප කරන අයෙකුට නැවත ශිෂ්‍යත්ව සඳහා අයදුම් කළ හැකිද?**

පිළිතුර - ශිෂ්‍යත්ව අවස්ථාවන් ප්‍රදානය කළ පසු එම අවස්ථාව ප්‍රතික්ෂේප කළහොත් එම අවස්ථාව වෙනත් අයෙකුට ප්‍රදානය කළ නොහැකි අතර එම අවස්ථාව රටට ලැබෙන ප්‍රදානයක් බැවින් අයදුම්කරුවන් මේ පිළිබඳව සැළකිලිමත් විය යුතුය. එසේ ප්‍රතික්ෂේප කළහොත් නැවත සලකා බලනු ලබන වසර තුලදී ශිෂ්‍යත්ව වැඩ සටහන් සඳහා අයදුම් කිරීමට අවස්ථාවන් ලබා නොදෙනු ඇත.

**IV. ප්‍රශ්නය - ශිෂ්‍යත්ව පිරිනමනු ලබන කාලසීමාවන් පිළිබඳ තොරතුරු දැන ගන්නේ කෙසේද?**


**පිළිතුර -** ශිෂ්‍යත්ව අවස්ථාවන් සම්බන්ධ දැන්වීම් වසර පුරාම වෙබ් අඩවියේ පළකරනු ලබන අතර, කාලසීමාවන් සම්බන්ධ තොරතුරු සඳහා අමාත්‍යාංශ වෙබ් අඩවිය වෙත පිවිසෙන්න.

**V. ප්‍රශ්නය - ප්‍රථම උපාධි ශිෂ්‍යත්වයක් ලබා ගැනීමෙන් පසුව මෙරට විශ්වවිද්‍යාලයක උපාධියක් හැදෑරීමට ඇති ඉඩ ප්‍රස්ථාවන් අහිමි වන්නේද?**

**පිළිතුර -** ශිෂ්‍යත්ව අවස්ථාවන් සඳහා අයදුම්කිරීමේදී මෙරට රාජ්‍ය විශ්වවිද්‍යාලයක අභ්‍යන්තර ශිෂ්‍යයෙකු වශයෙන් විශ්වවිද්‍යාලය තුල ලියාපදිංචි වී ඇත්නම් අයදුම්පත ප්‍රතික්ෂේප වේ.එමෙන්ම සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවීමට අපේක්ෂිත සිසුන්ගේ ලේඛනයක් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත යොමුකර ලියාපදිංචිය පිළිබඳ සනාථ කර ගනු ලැබේ. එමෙන්ම ශිෂ්‍යත්ව ලබා ගැනීමෙන් පසුව එම සිසුන්ගේ දත්ත ඇතුලත් ලේඛනයක් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත යොමුකරනු ලබන අතර එම සිසුන්ට මෙරට විශ්වවිද්‍යාලයක ලියපදිංචි විය නොහැක.

**VI.** **ශිෂ්‍යත්ව සඳහා පිරිනමනු ලබන උපාධි සඳහා වන පිළිගැනීම සම්බන්ධයෙන් දැනගනු ලබන්නේ කෙසේද?**

**පිළිතුර -** ශිෂ්‍යත්ව අවස්ථාවන් පිරිනමනු ලබන අදාළ විශ්වවිද්‍යාලය පිළිගැනීම සම්බන්ධයෙන් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිකුත්කර ඇති නිවේදනය අනුව පහත සඳහන් ලැයිස්තුවල අන්තර්ගතවේ නම් එම විශ්වවිද්‍යාලය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන විශ්වවිද්‍යාලයක් ලෙස සැලකේ. ඒ සම්බන්ධයෙන් වැඩිදුර තොරතුරු www.ugc.lk වෙබ් අඩවියේ Recognitions of foreign universities වෙබ් පිටුව වෙත පිවිසීමෙන් ලබා ගත හැක.



UNIVERSITY GRANTS COMMISSION - SRI LANKA

Recognition of Foreign Universities

UNIVERSITY GRANTS COMMISSION

NOTICE

The public is hereby informed that the University Grants Commission recognizes foreign Universities/Higher Educational Institutes based on international acceptance. Universities/Higher Educational Institutes that are listed in the following International Publications which are authentic sources of information on Universities and Higher Educational Institutes in different countries, are recognized at present;

1. **Commonwealth Universities Yearbook**
   (Published by Association of Commonwealth Universities)
2. **International Handbook of Universities**
   (Published by International Association of Universities)

It is the responsibility of the general public to verify from the above sources or the University Grants Commission the recognition of Universities/Higher Educational Institutes before registration for a degree awarded by a foreign University/Higher Educational Institute.

**Chairman**
**University Grants Commission**
18 December 2008

1. **Commonwealth Universities Yearbook**
   (Published by **Association of Commonwealth Universities**)
2. **International Handbook of Universities**
   (Published by **International Association of Universities**)